රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND DISASTER MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/21/01/04(තාවකාලික)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.04.25

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**
**දිස්ත්‍රික් ලේකම්වරුන්/**
**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාව ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම</u>**

සංවර්ධන නිලධාරී සේවයට පත් කිරීම හා අන්තර්ග්‍රහණය ක්‍රමවේදය අනුව උපාධිධාරීන් ඇතුළත් කර ගැනීමේදී එම බඳවා ගැනීමට අදාළ වන භාෂා මාධ්‍ය කුමක්ද යන්න පැහැදිලි නොවන බැවින් 2004.06.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 (I) විධිවිධාන අනුගමනය කරමින් නිලධරයාගේ පළමු භාෂා මාධ්‍ය තීරණය කළ යුතු අතර, එය නිලධරයා අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් මව් බස මට්ටමෙන් ලබා ගත් සිංහල හෝ දෙමළ විය හැකිය.

02. ඒ අනුව උපාධිය මූලික සුදුසුකමක් ලෙස සලකා සේවයට බඳවා ගෙන ඇති සංවර්ධන නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාව අනුව, අදාළ උපාධි පාඨමාලාව ඉංග්‍රීසියෙන් හදාරා තිබිය යුතු බවට කොන්දේසියක් පනවා නොමැති නම් හෝ ඉංග්‍රීසි භාෂා හැකියාව තනතුරට බඳවා ගැනීමේ දී පූර්ව සුදුසුකමක් ලෙස සලකා නොමැති යන අවස්ථා වලදී එම නිලධරයා විසින් 1998.12.30 දිනැති රාජ්‍ය පරිපාපන චක්‍රලේඛ 29/98 හි 3:2:1 – I සිට 3:2:1 – VIII දක්වා සුදුසුකම් සම්පූර්ණ කර තිබේනම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98(I) හි විධිවිධාන පරිදි භාෂා දිරි දීමනා ලබා ගැනීමට එම නිලධාරීන්ට හිමිකමක් ඇත.

03. ඒ අනුව, උපාධි පාඨමාලාවක් සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 හි 3:2:1 – VII උප ඡේදය යටතේ අදාළ කර ගත හැකි අතර උපාධි පාඨමාලාව ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂා විෂය හදාරා තිබීම 3:2:1 – VI උප ඡේදය යටතේ අදාළ කර ගත හැකිය. එකී සුදුසුකම් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 හි 3:2:5 උප ඡේදයේ දීමනාව ගෙවිය හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

04. ඒ අනුව, ඉහත ප්‍රතිපාදනයන්ට අනුකූලවන ලෙස සංවර්ධන නිලධාරීන් සඳහා අදාළ භාෂා දිරි දීමනා ගෙවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්